# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2016 (පැරණි නිර්දේශය)**

**2022 මාර්තු/අප්‍රේල්**

**මානවශාස්ත්‍ර පීඨය**

**සිංහල - SINH E 1025**

**චිරන්තන සිංහල ගද්‍ය පද්‍ය සාහිත්‍යය හා භාෂා ප්‍රවේශය**

**පළමුවන කොටසේ පළමු ප්‍රශ්නය ද , දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

### 1 කොටස

1. (අ) පහත සඳහන් ඡේදය ලිහිල් බසින් ලියා අවස්ථා සම්බන්ධය පැහැදිලි කරන්න.

"දේවයන් වහන්ස, අපි සේනාව රැස් කොට ගෙන පළමු කොට කුඩා නුවරක් වට කොට ගනුම්හ. මම කුරුබිලියෙන් ඇතුළු නුවරට වැද ඒ නුවර රජ්ජුරුවනට, "දේවයෙනි, තොප හා අප හා සටන් කොට කාරියෙක් නැති; හුදෙක් අප නතු වව. තොපගේ රාජ්‍යය තොපටම වන්නේය; සටන් කළෝ නම් අපගේ සේනා වාහන මහත් හෙයින් ඒකාන්තයෙන් ම පරදුව'යි කියමි. ඉදින් මා කී ලෙස නො කොළෝ නම්, සටන් කොට අල්ලා ගෙන මරා පියා උන්ගේ සේනාවත් හැර ගෙන අනෙක් නුවරකට යම්හ. ඒ නුවරත් එ සේ ම සටන් කොට ගෙන, ඉන් අනෙක් නුවරෙකැ යි මේ සැටියේ ම සියලු දඹදිව රාජ්‍යය ගෙන "ජය පානය අනුභව කරම්හ" යි කියා එක් සියයක් රජ දරුවන් අපගේ නුවරට ගෙන' වුත් උයනැදී රා මණ්ඩලයක් සාද උන් හැම දෙනා, රා බොන්නට යැ' යි රා මැඩිල්ලේ හිඳුවා ලා විෂ යොද කරන ලද්ද වූ රා අනුභව කරවා උන් හැම දෙනා ම ජීවිත විනාශයට පමුණුවා ගඟ දියට දමා එක් සියයක් රාජධානියෙහි රාජ්‍යය අත් පත් කොට ගනුම්හ. එ සේ කල්හි නුඹ වහන්සේ සියලු දඹදිවට අග රජ වන සේකැ"යි කීහ. රජ්ජුරුවෝ යහපත ආචාරීනි, තොප කී ලෙසම කෙරෙමි" කීහ.

(ලකුණු 10 යි)

(ආ) පහත සඳහන් පද්‍ය පන්තියේ අදහස් වත්මන් ලිහිල් බසින් ලියා කෙටි රසාස්වාදයක් කරන්න.

දෙ ළ දෙළ හුරුමුළ් පළ කළ පබළ දළ
ප ළ ප ළ පොරන යන මුව මී ගවර රළ
ද ළ ද ළ උදුළ මොළ ගජරළ කෙළි වතළ
බ ල ලෙල පුවළ පෙරමඟ වනගළ නැඹල

මිහිලොල් බිඟු සරේය වන සරේය
ගඟු ලැල් වැද සිරේය ගිරිසිරේය
පි පි මල් සපු තුරේය විසිතුරේය
වන සි රි සද කෙරේය ලොබ කෙරේය

ගිරිනිල් මල් රඟාය පිල් නඟාය
කරුසෙබඩුන් ළඟාය මනරඟාය
රිවි දෙව්හට රඟාය ගිරි රඟාය
සිටි මොනරුන් මඟාය වනමඟාය

කිරි ලෙස සමතලාය　　　　　　　　　　වැලිතලාය
සැදි සුවඳැති　　මලාය　　　　　　　　වනමලාය
එන වනසර　　කලාය　　　　　　　　　මනකලාය
දැක නෙත් ලත් පලාය ලැබ　　　　　　　පලාය

(ලකුණු 10යි)

## 11 කොටස

2. 'උම්මග්ග ජාතකයෙන් වඩාත් පිළිබිඹු වන්නේ බ්‍රාහ්මණ විරෝධී ආකල්පයකි.'සනිදර්ශනව විමර්ශනය කරන්න.

3. ස්වභාව සෞන්දර්ය වර්ණනයෙහි ලා හංස කවියා දැක්වූ චාතුර්යය පිළිබඳ ඇගයීමක් කරන්න.

4. කුරුණෑගල් යුගයේ ගද්‍ය සාහිත්‍යය පිළිබඳ සමාලෝචනයක් කරන්න.

5. සිංහල පද්‍ය සාහිත්‍ය ඉතිහාසයේ ගම්පොළ අවධිය සුවිශේෂ වන්නේ කවර කරුණු පාදක කරගෙන දැයි පරීක්ෂා කරන්න.

නැතහොත්

'සිව්පද කාව්‍ය සම්ප්‍රදායේ ස්වර්ණ යුගය කෝට්ටේ අවධියයි.'අදහස් දක්වන්න.

## 111 කොටස

6. 'භාෂාව' යනු කුමක්දැයි පිළිගත් නිර්වචනාශ්‍රයෙන් විග්‍රහ කරන්න.

7. උච්චාරණ ඉන්ද්‍රිය පද්ධතිය හඳුන්වා, ශබ්ද නිෂ්පාදන ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

8. සිංහල භාෂාවේ 'ද්විරූපතා' ලක්ෂණ හඳුනාගත හැකි ප්‍රධාන සාධක මොනවාදැයි පෙන්වා දෙන්න.

9. 'උපභාෂා' පහළවීම කෙරෙහි බලපාන ප්‍රධාන හේතු සාධක පිළිබඳ විභාග කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳ සටහන් ලියන්න.
    i. සන්ධි කිරීම් හා සන්ධි වීම්
    ii. ප්‍රාදේශීය උපභාෂා
    iii. සිංහලයේ පරිමිත භාෂා
    iv. භාෂණ සිංහලයේ අස්පර්ශ ශබ්ද
    v. කර්මකාරක වාක්‍ය රටා

(සෑම පිළිතුරකටම ලකුණු 20 බැගිනි)